# 53

දස මස මා ඔබෙ කුසේ දරා
මා හැදූ මගේ අම්මා
තුරුලෙ හොවාලා මා ඇති දැඩි කල
මගේ ආදර අම්මා

ආදර දෙවි සමිඳේ
මගේ ආදර අම්මා
ඔබගේ රැකවරණේ
සුරකිනු මැන සැම දා

දුක් කරදර මැද වෙහෙස දරා
මා හැදූ මගේ තාත්තා
දහඩිය හෙළලා මා ඇති දැඩි කල
මගේ ආදර තාත්තා

නොයෙකුත් බාධක සිඳ බිඳ ලා
මගේ මව් පිය දෙන්නා
සැමදා දෙවිඳුන් රැකවරණය තුල
වැජඹේවා සැම දා